**මඩුල්ල ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 24 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

(අ) <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී රු. 59,000 කට මිලදීගෙන තිබුණු කාර්යාල උපකරණ ප්‍රාග්ධනිතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | අත්වැරදීමකින් ප්‍රාග්ධනිතකර නොතිබුණු එම ස්ථාවර වත්කම් ඉදිරි වර්ෂයේදී ප්‍රාග්ධනිතකර නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | 2015 දෙසැම්බර් 28 දින පරිත්‍යාග ලෙස ලැබුණු රු.770,100ක් වටිනා ජල මනු 300 ක් පොදු ගබඩා ගිණුම හරකර ප්‍රාග්ධන යෙදුමට ආධාර මගින් දායකවීම ගිණුමට බැරකර තිබුණි. ඉන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා සවිකරන ලද ජල මනු 83 ක වටිනාකම රු. 213,061 ක් ප්‍රාග්ධන යෙදුමට ආධාර මගින් දායකවීමේ ගිණුමට හරකර පොදු ගබඩා ගිණුම බැරකර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී අදාල තොගය ප්‍රාග්ධනිතකර නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |

(ආ) විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------- | ------------ | ------------------------------ |
| රු. 1,099,174 ක් වූ වත්කම් විෂයකට අදාලව තොග සමීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී සමීක්ෂණ මණ්ඩලයක් මගින් වටිනාකම තක්සේරු කර ඉදිරිපත් කරමි. |

**1. 4** අනුකූල නොවීම්

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ---------------------- | ----------------- | ------------- | ----------------------------- |
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ප්‍රාදේශීය සභාවට අයත් වාහන 4 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහනය පරීක්ෂාකර නොතිබුණි. | චක්‍රලේඛයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වාහන 4 සඳහා ඉන්ධන දහනය පරීක්ෂාව කඩිනමින් සිදුකිරීමට කටයුතු කරමි. |

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,312,403 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,883,402 ක් විය.

**2.2** ආදායම් පරිපාලනය

**2.2.1** ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස්කල ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | - | - | - | - | 1,500 | - | - | - |
| (ii) | කුලී | 7,479,115 | 5,981,548 | 5,953,208 | 407,140 | 5,332,260 | 5,320,664 | 5,320,664 | 378,800 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 566,700 | 901,895 | 901,895 | - | 517,500 | 761,734 | 761,734 | - |
| (iv) | වෙනත් ආදායම් | 12,603,105 | 7,579,334 | 397,652 | 2,264,799 | 34,650,350 | 6,465,324 | 4,990,055 | 1,692,597 |
| | එකතුව | 20,648,920 | 14,462,777 | 7,252,755 | 2,671,939 | 40,500,110 | 12,547,722 | 11,072,453 | 2,071,397 |

## 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු. 14,462,777 ක් වූ මුළු ආදායමින් වර්ෂය අවසාන වන විට රු. 2,671,939 ක් හෙවත් සියයට 18 ක් අයකර නොතිබුණි. | හිඟ ආදායම් අයකරගත යුතුවේ. | 2019 අප්‍රේල් 30 වන විට තව දුරටත් හිඟව පවතින රු. 769,061 ක මුදල අයකර ගැනීමට කටයුතු කරමි. |

## 2.2.3 ව්‍යාපාර බදු අයකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මකුල්ල සතිපොලෙහි බදුකරු විසින් සමාලෝචිත වර්ෂයට අදාල බදු මුදල් නියමිත දිනට නොගෙවීම නිසා ප්‍රමාද දඩ රු. 49,914 ක් අයකරගෙන නොතිබුණි. | අයවිය යුතු දඩ මුදල් අයකර ගත යුතුවේ. | බදුකරු දැනුවත් කළ අතර ඔහු විසින් ඉදිරි මාස කිහිපය තුල රු.49,914ක ප්‍රමාද දඩ මුදල ගෙවා අවසන් කරන බව දන්වා ඇත. |

**2.2.4** උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති උසාවි දඩ රු. 302,497 ක් හා මුද්දර ගාස්තු රු. 1,446,502 ක් අයකර නොතිබුණි. | හිඟ උසාවි දඩ සහ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | 2019 මාර්තු 31 දිනට උසාවි දඩ මුදලින් රු.208,872 ක් අය වී ඇති බව සහ මුද්දර ගාස්තු මුදලින් රු.1,029,498ක් අයවී ඇත. |

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණි. | 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කළ යුතුවේ. | මෙතෙක් මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂිකව ක්‍රියාකාරකම් ඉටුකලේ අයවැය වාර්තාව අනුව හා යුරෝපා සංගමයේ සහයෝගීත්ව දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන 2016-2020 කාලය සඳහා පස්අවුරුදු දිස්ත්‍රික් ඒකාබද්ධ සංවර්ධන සැලැස්ම අනුව වන අතර, එම ලේඛන වලට අනුව මේවන විට වර්ෂයේ ළඟාකර ගැනීමට අවශ්‍ය අරමුණු සහ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් ඉටුකර ඇත. 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කරමි. |

(ආ) අත්හැර දැමූ කර්තව්‍යන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය මගින් නිශ්චිතව හඳුනාගෙන තිබුණු රු. 39,350,000 ක ඇස්තමේන්තු වටිනාකමක් සහිත කර්මාන්ත 38 ක් ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි. | වාර්ෂික අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන සලසා ඇති | අයවැය ලේඛනය මගින් ප්‍රාග්ධන වියදම් සඳහා රු.40,010,000ක් ඇස්තමේන්තුකර තිබුණද රු.660,000ක පමණක් ප්‍රතිපාදන සපයාගැනීමට හැකිවීම නිසා එම මුදලට අදාල තෝරාගත් කර්මාන්ත පමණක් සිදුකර ඇත. |

සියළු ව්‍යාපෘතීන් වර්ෂය තුල ක්‍රියාත්මක කළ යුතුවේ.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මඩුල්ල ප්‍රාදේශීය සභා මෙහෙයුම් නඩත්තු කමිටුව නමින් ලංකා බැංකුවේ ආරම්භ කර ඇති ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 2,713,794ක් වූ අතර ආරම්භයේ සිටම මෙම ගිණුමේ මුදල් අදාල අරමුණු ඉටුකර ගැනීම සඳහා භාවිතාකර නොතිබුණි. | අදාල ව්‍යාපෘති සඳහා ඉතිරි මුදල් භාවිතා කිරීම හෝ ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම කළ යුතුවේ. | ව්‍යාපෘතියේ ගිවිසුම් ප්‍රකාරව එම මාර්ග නඩත්තු කිරීමේ කාලසීමාව තුල නඩත්තු කටයුතු සිදු නොවේනම් සභා තීරණ මඟින් වෙනත් පොදු සංවර්ධන කටයුතු සඳහා එම මුදල් වෙන් කල හැකි වන අතර, ඒ අනුව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සිදුකල මාර්ගයක් හෝ කොල්ලදෙණිය තලාව මාර්ගය මීටර් 300ක් ඉදිකිරීමට සභා අනුමැතිය ලබාගෙන ඉදිකිරීම් කටයුතු මේවන විට ආරම්භ කර ඇත. |
| (ආ) | සභා බලප්‍රදේශයේ පිහිටා ඇති මාර්ග 450ක් හඳුනාගෙන තිබුණද මාර්ග ඉන්වෙන්ට්‍රියක් සකස්කර ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර නොතිබුණි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මේවන විට මාර්ග ගැසට් කිරීමට අවශ්‍ය සියළුම කටයුතු සිදුකර අවසන්ව ඇත. ඉදිරි මාසයක පමණ කාලසීමාවක් තුල මාර්ග ගැසට් කිරීමේ හැකියාව පවතී. |
| (ඇ) | 2014 වර්ෂයේ සිට පැවත එන රු. 584,822 ක කර්මාන්ත ණයහිමි ශේෂය සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතුකළ යුතුවේ. | සමාලෝචිත වර්ෂයේදීත් නිරවුල් නොකරන ලද කර්මාන්ත 9ක් මේවන විට පවතින අතර, මෙම කර්මාන්තවල මේවන තෙක් අතුරුඳවුම් මුදල් ගෙවා නැත. 2019 වර්ෂයේ දී ආදායම් ලෙස බැර කිරීමට කටයුතු කරමි. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා තනතුරු 02 කට අදාලව සේවකයින් තිදෙනෙකුගේ අතිරික්තයක් සහ තනතුරු 04 කට අදාලව සේවක පුරප්පාඩු 8ක් පැවතුණි. | අතිරික්ත කාර්ය මණ්ඩල තනතුරු අනුමත කර ගැනීමත්, පුරප්පාඩු සම්පූර්ණකර ගැනීමටත් කටයුතු කළ යුතුවේ. | අතිරික්ත සේවක සංඛ්‍යාව ඉදිරියේදී අනුමතකර ගැනීමට කටයුතු කරමි.<br><br>තාක්ෂණික නිලධාරියෙකු ලබා ගැනීම සඳහා පළාත්පාලන කොමසාරිස් වෙත ඉල්ලීම් කර ඇත.<br>පුස්තකාලයාධිපති සහ ආදායම් පරීක්ෂක තනතුරුවල වෙනත් නිලධාරීන් විසින් රාජකාරි ඉටුකරමින් පවතී.<br><br>රියදුරෙකු ලබා ගැනීම සඳහා පළාත්පාලන කොමසාරිස් වෙත ඉල්ලීම් කර ඇත. |

### 3.4 වත්කම් කළමනාකරණය

#### 3.4.1 නිෂ්ක්‍රීය /ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් පොදු ක්‍රීඩාංගනය පිහිටි ඉඩමේ තිබෙන සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල 2013 වර්ෂයේ පමණ සිට නිෂ්කාර්යව පැවතුණි. | නිෂ්කාර්ය වත්කම් ප්‍රයෝජනයට ගත යුතුවේ. | සභාව සතුව දැනට ගබඩාවක් නොමැති බැවින් ඉදිරියේදී ප්‍රයෝජනයට ගැනීම සඳහා භාණ්ඩ තොග එහි ගබඩා කර තබන බවත් ඉදිරියේදී විධිමත් කර ස්ථිර ලෙස පවත්වාගෙන යාමට කටයුතු කරමි. |
| රු. 20,976 ක් වූ ලීටර් 20 ධාරිතාවයෙන් යුතු කසල බඳුන් 76 ක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව ගබඩාකර තිබුණි. | නිෂ්කාර්ය වත්කම් ප්‍රයෝජනයට ගත යුතුවේ. | කසළ බඳුනක මිල රු. 276 ක් වන අතර එය වෙළඳපොල මිලට සාපේක්ෂව ඉහල වටිනාකමක් වන බැවින් මහජනතාව එය මිලදී ගැනීම ප්‍රතික්ෂේප කරන නිසා අලෙවි කිරීම අසීරු වී ඇත. |

**3.4.2** <u>වාහන උපයෝජනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් භාවිතා කරන වාහන 06 ක නීත්‍යානුකූල අයිතිය සභාවට පවරාගෙන නොතිබුණි. | සභාවට අයත් වාහන වල අයිතිය පවරා ගත යුතුවේ. | සභාව වෙත පවරාගෙන නොමැති වාහනවල අයිතිය ඉදිරියේදී පවරා ගැනීමට කටයුතු කරමි. |
| සභාව සතු වාහන දෙකක් සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබාගත යුතුවේ. | ඉදිරියේදී ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරමි. |

**3.5** <u>ප්‍රසම්පාදනය</u>

<u>ප්‍රසම්පාදන සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි. | අනුමත වාර්ෂික අයවැය ලේඛනයට අනුකූලව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇත. |

**4.** <u>ගිණුම් කටයුතු භාවය හා යහපාලනය</u>

**4.1** <u>අයවැය පාලනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය මගින් ඇස්තමේන්තු කළ ආදායම් හා වියදම් වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 05 ක සියයට 11 සිට සියයට 185 දක්වා ද වියදම් විෂයයන් 03 ක සියයට 11 සිට සියයට 24 දක්වාද විචලනයක් පැවතුණි. | තාත්වික අයවැය ලේඛනයක් පිළියෙල කර එහි දක්වා ඇති ඉලක්ක සපුරාගත යුතුවේ. | ඉදිරි වර්ෂයේදී අයවැය ගත ආදායම් රැස් කර ගැනීමට සහ ඇස්තමේන්තුගත වියදම් දැරීමටත් කටයුතු කිරීම තුලින් විචලනයන් අවම කරගැනීමට කටයුතු කරමි. |

**4.2** අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකල යුතුවේ. | විගණන විෂය භාරව කටයුතු කරන නිලධාරියා යොදාගෙන හෝ වෙනත් නිලධාරියෙක් අභ්‍යන්තර විගණන නිලධාරියෙක් ලෙස පත් කර අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. |

**4.3** විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2009 ජූනි 9 දිනැති අංක ඩීඑම්ජ්/ 2009 (01) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවෙහි අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛය අනුව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවිය යුතුවේ. | ඉදිරියේදී විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට කටයුතු කරමි. |